**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : **12** WW/O/22/12/09/04
වර්ණය : ඇම්බර්

# “මැන්ඩවුස්” සුළි කුණාටුව පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 දෙසැම්බර් මස 09 දින ප.ව. 01.00 තෙක් වලංගු වන පරිදි
2022 දෙසැම්බර් මස 09 දින පෙ.ව. 10.00 ට නිකුත් කරන ලදී.

**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ ගිනිකොණ දිග සහ නිරිතදිග බෙංගාල බොක්ක සඳහා**

## සැලකිලිමත් වන්න!

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ (යාපනයට කි.මී. 230ක් පමණ නැගෙනහිරට බරව ඊසාන දෙසින් සහ ත්‍රිකුණාමලයට කි.මී. 270ක් පමණ උතුරට බරව ඊසාන දෙසින්) ස්ථාපිත වී පවතින “මැන්ඩවුස්” චණ්ඩ සුළි කුණාටුව අද දින පෙ.ව. 05.30 වන විට අක්ෂාංශ 11.0N සහ දේශාංශ 81.7E ආසන්නයේ ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය බටහිරට බරව වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 09 රාත්‍රී කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචේරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ් වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**


උතුරු අක්ෂාංශ 07ත් 15ත් සහ නැගෙනහිර දේශාංශ 80ත් සහ 86ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය උපරිම වශයෙන් පැ.කි.මී. (70-90) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 100 දක්වා වැඩිවිය හැක.

මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ දළ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

කන්කසන්තුරය සිට මුලතිවු හරහා ත්‍රිකුණාමලය දක්වා ප්‍රදේශවල මුහුදු රළ මීටර් 2.5-3.5 ක් පමණ (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතී. මේ හේතුවෙන් ඉහතින් දක්වා ඇති ප්‍රදේශවල මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

උතුරු අක්ෂාංශ 02ත් 06 ත් සහ නැගෙනහිර දේශාංශ 78ත් සහ 86ත් අතර දකුණු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය උපරිම වශයෙන් පැ.කි.මී. (40-50) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 70 දක්වා වැඩිවිය හැක. මෙම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු විය හැක.

සුළි කුණාටුවේ අපේක්ෂිත ගමන් මාර්ගය **(Source: RSMC India)**



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පද්ධතියේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

| දිනය/ වේලාව (පැය) | පිහිටීම ( අක්ෂාංශ/ දේශාංශ) | උපරිම සුළං වේගය ( පැ.කි.මී) | වර්ගය |
|---|---|---|---|
| 09.12.22/11.30 | 11.5/81.2 | 80-90, 100 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 09.12.22/17.30 | 12.0/80.7 | 70-80, 90 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 09.12.22/23.30 | 12.4/80.3 | 65-75, 85 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 10.12.22/05.30 | 12.7/80.0 | 55-65, 75 දක්වා වැඩි විය හැක | ගැඹුරු පීඩන අවපාතය |
| 10.12.22/17.30 | 13.0/79.4 | 30-40, 50 දක්වා වැඩි විය හැක | පීඩන අවපාතය |

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **මන්නාරම සිට කන්කසන්තුරය ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වලට සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ වලට (07N - 15N, 80E – 86E), සහ දකුණු මුහුදු ප්‍රදේශවලට (02N - 06N, 78E – 86E) නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

***පද්ධතිය අඛණ්ඩ නිරීක්ෂණ යටතේ පවතින අතර මීළඟ පණිවිඩය, 2022 දෙසැම්බර් 09 ප.ව.01.00 ට නිකුත් කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **12** WW/O/22/12/09/04
COLOR: **Amber**

# Advisory for Cyclonic storm "Mandous".

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 10.00 a.m. 09 December 2022, valid until 01.00 p.m. 09 December 2022

## For deep and shallow sea areas from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southeast & Southwest Bay of Bengal.

**PLEASE BE AWARE!**

**The Severe Cyclonic storm "Mandous" lay centered over Southwest Bay of Bengal (230 km east-northeast of Jaffna and 270km north-northeast of Trincomalee) near latitude 11.0N and longitude 81.7E at 05.30 a.m today. It is very likely to move west-northwestwards and cross North Tamil-Nadu, Puducherry and South Andhra Pradesh coast around mid-night of 09$^{th}$ December.**


Maximum wind speeds will be (70-90) kmph and can increase up to 100 kmph in sea areas between (07N – 15N, 80E – 86E).

Heavy showers or thundershowers and very rough to high seas can be expected in aforementioned sea areas.

There is a possibility that near-shore sea areas off the coast extending from Kankasanturai to Trincomalee via Mullaitivu may experience surges due to swell waves of (about 2.5 m – 3.5 m) height (This is not for land area).

Southern sea areas bounded by (02N - 06N, 78E – 86E) will be very rough at times and wind speeds will be (40-50) kmph and can increase up to 70 kmph in the Southern sea areas.

**Expected path of the cyclone (Source: RSMC-India)**



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**The forecast track and intensity of the system are given in the following table**

| Date/Time (SLST) (Hrs) | Position (Lat. °N/ Long. °E) | Maximum wind speed (Kmph) | Category of cyclonic disturbance |
|---|---|---|---|
| 09.12.22/11.30 | 11.5/81.2 | 80-90 gusting to 100 | Cyclonic Storm |
| 09.12.22/17.30 | 12.0/80.7 | 75-80 gusting to 90 | Cyclonic Storm |
| 09.12.22/23.30 | 12.4/80.3 | 65-75 gusting to 85 | Cyclonic Storm |
| 10.12.22/05.30 | 12.7/80.0 | 55-65 gusting to 75 | Deep Depression |
| 10.12.22/17.30 | 13.0/79.4 | 30-40 gusting to 50 | Depression |

**Actions Required:**

- **Naval and fishing communities are advised not to venture into the deep and shallow sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southwest Bay of Bengal (07N - 15N, 80E – 86E) and Southern sea areas (02N - 06N, 78E – 86E), until further notice.**

- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**

- **Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

***The system is under continuous surveillance and the next message will be issued at 01.00 p.m., 9th Dec, 2022.